# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 243/27 — 1976 දෙසැම්බර් 17 වැනි සිකුරාදා — 1976.12.17

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ජනා.කා. අංකය : ඩබ්ලිව්. 68 (70)/76.

**(40 වන අධිකාරය වූ) මහාජන ආරක්ෂක ආඥාපනත**

අගමැතිගේ නිර්දේශය අනුව (40 වන අධිකාරය වූ) මහාජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලැබූ නියෝග.

වි. ගොපල්ලව,
ජනාධිපතිවරයා.

1976 දෙසැම්බර් මස 17 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. වෙන යම් ලිඛිත නීතියක කුමක් සඳහන් ව ඇත ද, මෙහි වූ උපලේඛනයෙහි I වන තීරයේ නිශ්චිතව සඳහන් එක් එක් පළාත් පාලන ආයතනයේ කටයුතු පිළිබඳ පරිපාලනය, ඒ එක් එක් පළාත් පාලන ආයතනය පිහිටා ඇති පරිපාලන ප්‍රදේශයෙහි පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත, මෙම නියෝග බලපවත්වන තාක් හා ඒ තාක් පමණක් 1976 දෙසැම්බර් මස 17 වන දින සිට පැවරෙන්නේය. තවද, ඒ අනුව ඒ එක් එක් පළාත් පාලන ආයතනයේ කටයුතු පිළිබඳ පරිපාලනය පැවරී ඇති පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් ඉහත කී කාලපරිච්ඡේදය තුළ මෙම උපලේඛනයේ II තීරයේ නිශ්චිතව සඳහන් ආඥාපනත් යටතේ හෝ වෙන යම් ලිඛිත නීතියක් යටතේ එම පළාත් පාලන ආයතනයේ හෝ එහි සභාපතිගේ බලතල ක්‍රියාවේ යෙදවීම හා කාර්ය ඉටුකිරීම කළ යුතුය.

2. 1 වන නියෝගයේ "පළාත් පාලන ආයතනය" යන යෙදුමෙන් යම් සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වේ.

උපලේඛනය

| I තීරය | II තීරය |
|---|---|
| වලව ගම් සභාව ... | ... ගම් සභා ආඥාපනත (257 වන අධිකාරය) |
| ඕතර පළාත දකුණ ගම් සභාව ... | ... ගම් සභා ආඥාපනත (257 වන අධිකාරය) |
| සිත්තරම් පළාත ගම් සභාව ... | ... ගම් සභා ආඥාපනත (257 වන අධිකාරය) |
| බෙම්මුල්ල ගම් සභාව ... | ... ගම් සභා ආඥාපනත (257 වන අධිකාරය) |
| මාටඹුව කෝරළේ ගම් සභාව ... | ... ගම් සභා ආඥාපනත (257 වන අධිකාරය) |
| ඌරගස්මන්හන්දිය ගම් සභාව ... | ... ගම් සභා ආඥාපනත (257 වන අධිකාරය) |
| පොළොන්නරුව සුළු නගර සභාව | ... සුළු නගර සභා ආඥාපනත (256 වන අධිකාරය) |
| නාත්තන්ඩිය සුළු නගර සභාව ... | ... සුළු නගර සභා ආඥාපනත (256 වන අධිකාරය) |
| බෙන්තොට සුළු නගර සභාව ... | ... සුළු නගර සභා ආඥාපනත (256 වන අධිකාරය) |
| දිඹුල ගම් සභාව ... | ... ගම් සභා ආඥාපනත (257 වන අධිකාරය) |
| ඉබ්බාගමුව ගම් සභාව ... | ... ගම් සභා ආඥාපනත (257 වන අධිකාරය) |
| ගන්දහය දකුණ අංක 2 ගම් සභාව ... | ... ගම් සභා ආඥාපනත (257 වන අධිකාරය) |
| උඩපනේ ගම් සභාව ... | ... ගම් සභා ආඥාපනත (257 වන අධිකාරය) |


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

57A——ඒ 24318—2,100 (76/12)